# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම

## 2027 අධ්‍යයන වර්ෂය

මෙම විශ්වවිද්‍යාලය මගින් පහත දැක්වෙන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා **2026.11.30** දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### *1. එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (M.A.) (SLQF 09 - 30 Credits)*

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යයන මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි | | |
| පාඨමාලා ගාස්තුව | : | දේශීය සිසුන් සඳහා | - | රු. 45,000/- |
| | | විදේශීය සිසුන් සඳහා | - | US$ 555 |
| අධ්‍යයන විෂය ධාරාව | : | බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/සංස්කෘත/ඉංග්‍රීසි/පුරාවිද්‍යාව | | |

<u>ලියාපදිංචිය සඳහා සුදුසුකම්</u>

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.
  හෝ
- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.

  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

### *2. ශාස්ත්‍රපති (දැවුරුදු) පර්යේෂණ උපාධි පාඨමාලාව (M.A.) (SLQF 10 - 60 Credits)*

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යයන මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි | | |
| පාඨමාලා ගාස්තුව | : | දේශීය සිසුන් සඳහා | - | රු. 74,500/- |
| | | විදේශීය සිසුන් සඳහා | - | US$ 705 |
| අධ්‍යයන විෂය ධාරාව | : | බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/සංස්කෘත/ඉංග්‍රීසි/පුරාවිද්‍යාව | | |

<u>ලියාපදිංචිය සඳහා සුදුසුකම්</u>

ඉහත අංක 01 යටතේ වන සුදුසුකම්
හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.

**පාඨමාලා ව්‍යුහය**

ලිඛිත ප්‍රශ්න පත්‍ර 06ක් ඇතුළත් වේ. සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වේ.

| **<u>බෞද්ධ අධ්‍යයන</u>** | | **<u>Buddhist Studies</u>** | |
|---|---|---|---|
| බුදුදහමේ මූලික ඉගැන්වීම් | - MABS 53015 | Fundamental Buddhist Teachings | - MABS 53015 |
| බුදුසමය හා සමයාන්තර දර්ශනය | - MABS 53025 | Buddhism and Inter-Religious Philosophy | - MABS 53025 |
| බුදුදහම හා කළමනාකරණය | - MABS 53035 | Buddhism and Management | - MABS 53035 |
| බුදුසමය සහ මනස්චිකිත්සාව | - MABS 53045 | Buddhism and Psychotherapy | - MABS 53045 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |
| බෞද්ධ සමාජ දර්ශනය හා නූතන ලෝකය | - MABS 53055 | Buddhist Social Philosophy and Modern World | - MABS 53055 |
| **හෝ** | | **Or** | |
| ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා හා වාස්තු විද්‍යාව | - MABS 53075 | Buddhist Art and Architecture | - MABS 53075 |

| **<u>පාලි</u>** | | **<u>Pali</u>** | |
|---|---|---|---|
| බුදුදහමේ මූලික ඉගැන්වීම් | - MABS 53015 | Fundamental Buddhist Teachings | - MABS 53015 |
| පාලි සූත්‍ර අධ්‍යයනය | - MAPL 53025 | Pali Sutra Studies | - MAPL 53025 |
| පාලි භාෂාවේ සමාජ භාවිතය | - MAPL 53035 | The Social Usage of Pali Language | - MAPL 53035 |
| පාලි අභිධර්ම අධ්‍යයනය | - MAPL 53045 | Pali Abhidhamma Studies | - MAPL 53045 |
| පාලි කාව්‍යය හා සාහිත්‍ය විචාරය | - MAPL 53055 | Pali Poetry and Literary Criticism | - MAPL 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |

| **<u>සංස්කෘත</u>** | | **<u>Sanskrit</u>** | |
|---|---|---|---|
| බුදුදහමේ මූලික ඉගැන්වීම් | - MABS 53015 | Fundamental Buddhist Teachings | - MABS 53015 |
| සංස්කෘත ව්‍යාකරණ අධ්‍යයනය (පාදිනි - පාදක) | - MASN 53025 | Sanskrit Grammar Studies (Pāṇini-Base) | - MASN 53025 |
| සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය (වෛදික - ලෞකික) | - MASN 53035 | Sanskrit Literature Studies (Vedic and Worldly) | - MASN 53035 |
| බෞද්ධ සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය (මහායාන නවධර්ම හා දාර්ශනික ග්‍රන්ථ) | - MASN 53045 | Studies of Buddhist Sanskrit Literature (Nine-Discourses and Philosophical Works in Mahāyāna) | - MASN 53045 |
| සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය | - MASN 53055 | History of Sanskrit Literature | - MASN 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - MARM 53065 | Research Methodology | - MARM 53065 |

**සිංහල**

| | | |
|---|---|---|
| චිරන්තන සිංහල ගද්‍යය හා ව්‍යාඛ්‍යාන සාහිත්‍යය | - | MASI 53015 |
| චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය | - | MASI 53025 |
| සිංහල ජනශ්‍රැතිය හා කලාශිල්ප | - | MASI 53035 |
| සිංහල භාෂාව, ව්‍යාකරණය හා වාග්විද්‍යාව | - | MASI 53045 |
| නූතන සිංහල සාහිත්‍යය | - | MASI 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |

**පුරාවිද්‍යාව**

| | | |
|---|---|---|
| බුදුදහමේ මූලික ඉගැන්වීම් | - | MABS 53015 |
| සංස්කෘතික සංචාරණය | - | MAAR 53025 |
| උරුම කළමනාකරණය හා මහජන පුරාවිද්‍යාව | - | MAAR 53035 |
| අභිලේඛන හා සංකේත අධ්‍යයනය | - | MAAR 53045 |
| පුස්කොළ ලේඛන අධ්‍යයනය හා සංරක්ෂණය | - | MAAR 53055 |
| පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |

**English**

| | | |
|---|---|---|
| Fundamental Buddhist Teachings | - | MABS 53015 |
| Dramatic Genres | - | MAEN 53025 |
| Literary Traditions in Poetry | - | MAEN 53035 |
| Themes in Fiction | - | MAEN 53045 |
| Language Pedagogy | - | MAEN 53055 |
| Research Methodology | - | MARM 53065 |

**අයදුම්පත් ගාස්තුව :**

බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි (එක් අවුරුදු/දෑවුරුදු) - රු. 1000/-

**අයදුම් කළ යුතු පිළිවෙල :**

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක **711202** ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගත හැකි ය. තැපැල් මගින් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''X4'' ප්‍රමාණයේ රු. 110/ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'අයදුම්පත්‍ර ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,<br>
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය,<br>
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,<br>
අංක 214, බෞද්ධාලෝක මාවත,<br>
කොළඹ 07.

**අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතු ය. (M.A.)**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සැලකිය යුතුයි :** **ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) උපාධි පාඨමාලාව සඳහා ඉංග්‍රීසි විෂය ධාරාවෙන් පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම්, ශාස්ත්‍රවේදී/ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

**හෝ**

**ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යය/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්වවිද්‍යාලයකින් පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.**

**සහ**

**එම අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් අනතුරුව ඉංග්‍රීසි අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ ලිඛිත පරීක්ෂණයට පෙනී සිට ඉන් සමත් විය යුතුය.(ලියාපදිංචි කර ගැනීම ඉන් අනතුරුව සිදු කෙරේ)**

**අයදුම්පත් නිකුත් කරන අවසාන දිනය**

ශාස්ත්‍රපති (එක් අවුරුදු/දෑවුරුදු) පාඨමාලා සඳහා **2026.11.27** දින දක්වා පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.11.30** දිනට පෙර ඉහත ලිපිනයට යොමු කළ යුතු ය.

වැඩි විස්තර සඳහා : 0112580609